# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2023/51 - 2017 ජුනි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2017.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (II)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 (1) (ද) වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ වහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය,
සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය.

2017 ජුනි මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම කළමනාකරණය කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. දේශීය පරිභෝජනය සඳහා ආනයනය කරනු ලබන මත්ස්‍ය විශේෂ හෝ ධීවර නිෂ්පාදන වලට අදාළ වන්නාවූ 1980 අංක 26 දරන ආහාර පනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද යම් නියෝග වලට යටත්ව ආහාර පිණිස හෝ මිනිස් පරිභෝජනයට හෝ ධීවර ඇම ලෙස භාවිතා කිරීම සඳහා ශීත කළ හෝ නොකළ හෝ ටින්කළ අජීවී හෝ සජීවී තත්ත්වයේ මත්ස්‍ය විශේෂ හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රති අපනයනය කිරීම සිදු කරනු ලබන යම් තැනැත්තකු මෙම නියෝගවල නියමයන්ට හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

3. යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රතිඅපනයනය කිරීම අන්තර්ජාතික බැඳීම්වල නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට සහ (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත සහ 1969 අංක 1 දරන ආනයනය හා අපනයනය (පාලන) පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

4. යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනකරුවකු, ආනයනකරුවකු හෝ ප්‍රති අපනයනකරුවකු විසින් තර්ජනයට ලක් වූ ස්වාභාවික සත්ව හා ශාක සම්බන්ධ අන්තර් ජාතික වෙළඳ සම්මුතිය (සයිටේස්/CITES) යටතේ සඳහන් කරනු ලැබ ඇති නියමයන් සපුරාලිය යුතු ය.


1A - PG 3570 — 2757 (2017/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

***යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම සඳහා ලියාපදිංචි කිරීම***

5. යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීමෙහි නියැලී සිටින යම් තැනැත්තකු එම කාර්ය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය.

6. යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම සඳහා යම් ආයතනයක් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු මෙම නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පිළිවෙලින් ආකෘතිය 1, ආකෘතිය 2 සහ ආකෘතිය 3 අනුව වූ අයදුම්පතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඔහු විසින් නිකුත් කරන ලද කොන්දේසි හා නියමයන්ට යටත්ව ඉදිරිපත් කළ යුතු ය.

7. මෙහි 2 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති වාර්ෂික ලියාපදිංචි ගාස්තුව ඉල්ලුම්කරු විසින් ආයතනය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සමග ගෙවිය යුතු ය.

8. යම් බලයලත් නිලධරයකු විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශවලට අනුව අදාළ ආයතනයේ හෝ සමාගමේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් කළ යුතු ය.

## II වන කොටස

***මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම සඳහා වන අවශ්‍යතා***

9. වලංගු පැටවුම් බිල්පතක් හෝ ගුවන් මාර්ග බිල්පතක් සහිතව ශ්‍රී ලංකාව තුළට ඇතුළු වන යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ වේ.

10. වලංගු පැටවුම් බිල්පතක් හෝ ගුවන් මාර්ග බිල්පතක් නොමැතිව ශ්‍රී ලංකාව තුළට ඇතුළු වන හෝ ප්‍රවාහනය කරනු ලබන යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන 2015 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට හා පිටු දැකීමට වරායන් තුළ රජයේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝගවලට යටත් විය යුතු ය.

11. මසුන් හෝ ධීවර නිෂ්පාදන සම්බන්ධයෙන් වරාය තුළ ගනුදෙනු කටයුතු සිදු කරනු ලබන යම් තැනැත්තකු විසින් පැටවුම් බිල්පත සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් නිශ්චය කරනු ලැබිය හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

12. මෙම නියෝග බලාත්මකභාවයට පත්වීමට පෙර කිසිදු තැනැත්තකු විසින් 2003 අංක 1 දරන මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නියෝග යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති යම් ආයතනයක් යොදා ගැනීමෙන් මිස යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය හෝ ප්‍රතිඅපනයනය නොකළ යුතු ය.

13. යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු විසින් මත්ස්‍ය විශේෂය සහ නිෂ්පාදනයේ වර්ගය හා ආකාරය ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩ පිළිබඳ කේත පද්ධතියට අනුකූල අදාළ එච්. එස්. කේතයන් යටතේ සඳහන් කළ යුතු ය.

14. කිසිදු තැනැත්තකු විසින් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ තහනම් කරනු ලැබ ඇති යම් මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රතිඅපනයනය කිරීම නොකළ යුතු ය.

15. කිසිදු තැනැත්තකු විසින් කලාපීය ධීවර කළමනාකරණ ආයතනයක් විසින් නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර කටයුතු මගින් ලබාගන්නා ලද බවට වර්ගීකරණය කරන ලද හෝ ප්‍රකාශයට පත්කරන ලද මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම නොකළ යුතු ය.

16. කිසිදු තැනැත්තකු විසින් ඒ සමග ඉදිරිපත් කරනු ලබන අදාළ සත්‍යායනය කරන ලද ලොග් සටහනින් පැහැදිළිව නිශ්චය කළ නොහැකි මසුන් හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම නොකළ යුතු ය.

17. 2014 මසුන් ඇල්ලීම පිළිබඳ දත්ත රැස් කිරීමේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුව නිත්‍යානුකූල ලෙස අල්ලනු ලැබූ මසුන් හෝ එවැනි මසුන්ගෙන් සාදන ලද ධීවර නිෂ්පාදනයක් බවට වන වලංගු ලේඛනයක් හෝ අදාළ අවස්ථාවන් හී දී වලංගු මසුන් ඇල්ලීමේ සහතිකයක් නොමැතිව කිසිදු තැනැත්තකු විසින් යම් මසුන් හෝ ධීවර නිෂ්පාදනයක් අපනයනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රතිඅපනයනය කිරීම නොකළ යුතු ය.

18. මත්ස්‍ය විශේෂ පිළිබඳ සියලු තොරතුරු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන අදාළ කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයේ සංඛ්‍යාලේඛන ලේඛනගත කිරීමේ ක්‍රමවේදය යටතේ ඉදිරිපත් කළ යුතු ය.

19. 18 වන නියෝගයේ සඳහන් සංඛ්‍යාලේඛන අදාළ මසුන් අල්ලනු ලැබූ යාත්‍රාවේ ධජ රාජ්‍යයේ බලයලත් රජයේ නිලධරයකු විසින් හෝ යාත්‍රාව යම් කුළී ගිවිසුමක් යටතේ මසුන් අල්ලනු ලබන අවස්ථාවක දී මසුන් අපනයන රාජ්‍යයේ බලයලත් නිලධරයකු විසින් සහතික කළ යුතු ය.

20. මෙම සංඛ්‍යාලේඛනවලට අදාළ ප්‍රතිඅපනයන සහතිකය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින් සහතික කළ යුතු ය.

21. සංරක්ෂණ කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන විෂයය පරවා ඇති අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් ලෙස අපනයනය හෝ ප්‍රතිඅපනයනය සඳහා තහනම් කාලසීමා හෝ පිරිවිතරයන්ගේ, ප්‍රමාණයේ, ආකාරයේ, ස්වභාවයේ හා කාලයේ සීමා කිරීම් පනවනු ලැබිය හැකි ය.

## III වන කොටස

### *මසුන් හා ධීවර නිෂ්පාදන ආනයනය කිරීම සහ අපනයනය කිරීම හෝ ප්‍රතිඅපනයනය කිරීම සඳහා සැකසීම සිදු කරනු ලබන ආයතන පරීක්ෂා කිරීම*

22. මසුන් හෝ ධීවර නිෂ්පාදන ආනයනකරුවකු, මසුන් හෝ ධීවර නිෂ්පාදන සැකසීම සිදු කරනු ලබන ආයතනයක හිමිකරු හෝ බලපත්‍රලාභියකු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු හට, පූර්ව දැනුම්දීමකින් තොරව ආයතනයට ඇතුළුවීමට, පරීක්ෂා කිරීමට, සාම්පල හා දත්ත සහ ලේඛන එම ආයතනයේ දී හෝ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී එකතු කිරීමට අවසර ලබාදීම හා පහසුකම් සැලැස්වීම කළ යුතු ය.

23. ඉහත නියෝගය අනුව පරීක්ෂා කිරීමෙන් පසුව දින හතක් ඇතුළත විස්තරාත්මක පරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ බලය පවරන ලද නිලධරයා විසින් ලබා දිය යුතු ය.

## IV වන කොටස

### *ලියාපදිංචිය හා බලපත්‍ර තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම*

24. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කර ඇති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම උල්ලංඝනය කිරීමේ බරපතලභාවය සැලකිල්ලට ගෙන මෙම නියෝග යටතේ නිකුත් කරන ලද ලියාපදිංචිය හෝ බලපත්‍ර මාස හයක් නොඉක්මවනු ලබන යම් කාලසීමාවක් සඳහා තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ යුතු ය.

25. අවස්ථාවෝචිත පරිදි, යම් සහතිකයක් ප්‍රදානය කිරීම හෝ නිකුත් කරන ලද සහතිකයක් අළුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් ඉල්ලුම්කරුවකුට හෝ තැනැත්තකුට එම තීරණය ලබාදුන් දින සිට දින තිහක් ඇතුළත එම තීරණයට එරෙහිව ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමට හිමිකම තිබිය යුතු ය.

26. ලේකම්වරයා විසින් එවැනි අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූවිට, ඔහු වසින් අවශ්‍ය යයි හෝ උචිත යයි සලකනු ලබන යම් විමසීම් සිදු කිරීමෙන් පසුව -

(අ) අභියාචනයට අවසර දෙමින් අවස්ථාවෝචිත පරිදි, සහතිකය නිකුත් කරන ලෙස හෝ නිකුත් කරන ලද සහතිකයක් අළුත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කිරීම ; හෝ

(ආ) අභියාචනයට අවසර නොදෙමින් හා අභියාචනය ඉදිරිපත් කරන ලද්දේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යම් තීරණයකට එරෙහිව ද එකී තීරණය තහවුරු කිරීම කළ හැකි ය.

27. මෙම නියෝගවල -

''ගුවනින් ප්‍රවාහනය'' යන්නෙන් ගුවනින් ආනයනය, අපනයනය හෝ ප්‍රතිඅපනයනය කිරීම අදහස් වේ ;

''බලයලත් නිලධාරි'' යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලය පවරන ලද නිලධරයකු අදහස් වේ ;

''ඇම'' යන්නෙන් මසුන් හෝ වෙනත් සත්වයකු ආකර්ෂණය කර ගැනිම සඳහා ධීවර ආම්පන්නයකට යොදන ආහාරමය කොටසක් අදහස් වේ ;

''මසුන් ඇල්ලීමේ සහතිකය'' යන්නෙන් ධීවර යාත්‍රාවකින් අල්ලනු ලැබූ අදාළ මත්ස්‍ය වර්ගයක මසුන් නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් යම් ක්‍රියාකාරකමක මසුන් නොවන බවට එම යාත්‍රාව අයත් ධජ රාජ්‍යයේ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන සහතිකය අදහස් වේ ;

''සයිටේස් CITES'' යන්නෙන් තර්ජනයට ලක් වූ ස්වාභාවික සත්ව හා ශාක සම්බන්ධ අන්තර්ජාතික වෙළඳ සම්මුතිය අදහස් වේ ;

''තහනම් කාලසීමා'' යන්නෙන් නම් කරන ලද යම් මත්ස්‍ය වර්ගයක් ඇල්ලීමට අවසර දෙනු නොලබන වසරේ යම් කාලසීමාවක් අදහස් වේ ;

''අධ්‍යක්ෂ ජනරාල්'' යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

''මසුන් හෝ ධීවර නිෂ්පාදන'' යන්නෙන් ආහාර පිණිස හෝ මිනිස් පරිභෝජනය හෝ ධීවර ඇම ලෙස භාවිතා කිරීම සඳහා වන ශීත කළ හෝ නොකළ හෝ ටින් කළ අජීවී හෝ සජීවී තත්ත්වයේ මසුන් හෝ ධීවර නිෂ්පාදන අදහස් වේ ;

''එච් එස් කේතය'' යනු බඳු නාමකරණයේ සංයෝජිත වර්ගීකරණ සංකේත පද්ධතියක් (එච් එස්) ලෙස ද හඳුන්වන සංයෝජිත භාණ්ඩ වර්නන (විස්තර කිරීමේ) සහ කේතීකරණ පද්ධතියකි. මෙය වෙළඳ භාණ්ඩයක් වර්ගීකරණය සඳහා නම් සහ අංකයන් ඇතුළත් ජාත්‍යන්තර වශයෙන් ප්‍රමිතිකරණය කරනු ලැබූ පද්ධතියක් වේ ;

''නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත්'' යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14 උ වගන්තියේ සඳහන් ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ අංක 11/03 යෝජනා සම්මතයේ 1 වන ඡේදයේ දක්වා ඇති ක්‍රියාකාරකම් අදහස් වේ ;

''සැකසීම'' යන්නෙන් අපනයනය, ආනයනය හා ප්‍රතිඅපනයනයට යටත් වන්නාවූ මසුන් හෝ ධීවර නිෂ්පාදනවලට සිදු කරනු ලබන යම් ආකාරයක අගය එකතු කිරීමක් අදහස් වේ ;

''ප්‍රති අපනයනය'' යන්නෙන් ආනයනය කරනු ලැබූ භාණ්ඩ හෝ නිෂ්පාදන වෙනත් රටකට අපනයනය කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ ;

''කලාපීය ධීවර කළමනාකරණ ආයතන'' යන්නෙන් ධීවර කටයුතු සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය කිරීම සඳහා අන්තර්ජාතික ධීවර එකඟතාවයක් හෝ වැඩ පිළිවෙලක පාර්ශවකරුවන් වන රාජ්‍යයන් හෝ සංවිධාන එක්ව ක්‍රියා කරනු ලබන යාන්ත්‍රණයක් අදහස් වේ ;

''තුන්වන පාර්ශවයේ අපනයනකරු'' යන්නෙන් ආනයනය කරන ලද මසුන් හෝ ධීවර නිෂ්පාදන වෙනත් යම් තැනැත්තකුට හෝ පාර්ශවකරුවකුට අයත් අනුමත ආයතනයක සැකසීම සිදු කිරීමෙන් අනතුරුව ප්‍රතිඅපනයනය සිදු කරනු ලබන යම් තැනැත්තකු හෝ පාර්ශවයක් අදහස් වේ ;

''යාත්‍රාව'' යන්නෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන හෝ ධීවර කර්මාන්තයේ යෙදීමට බලාපොරොත්තු වන යම් යාත්‍රාවක්, නැවක් හෝ බෝට්ටුවක් අදහස් වේ ;

''ලෝක වෙළඳ සංවිධානය'' යන්නෙන් ජාතීන් අතර වෙළඳ කටයුතු පිළිබඳ නීතිරීති සම්බන්ධව කටයුතු කරන ජාත්‍යන්තර සංවිධානය අදහස් වේ ;

*උපලේඛනය* - I

**ආකෘති පත්‍ර I**

මසුන් හා ධීවර නිෂ්පාදන (සජීවී/සැකසූ) අපනයනය සඳහා ආයතන හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ අයදුම්පත

1. අයදුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම :
2. ලිපිනය :
3. සම්බන්ධතා අංකය (දුරකථන/ෆැක්ස්) සහ විද්‍යුත් තැපැල් ලිපිනය :
4. අපේක්ෂිත නිෂ්පාදනයේ වර්ගය හා සැකසීමේ ක්‍රමය :

| *මසුන් හා ධීවර නිෂ්පාදන වර්ගය (විශේෂ නාමය)* | *එච්. එස්. කේතය* | *නිෂ්පාදනයේ වර්ගය (ආහාර සඳහා, සුරතල් මසුන්, ධීවර ඇම හෝ වෙනත්)* | *නිෂ්පාදනයේ වර්ගය (සජීවී, අමුද්‍රව්‍ය, සැකසූ සහ වෙනත්)* | *ස්වභාවය (සජීවී, අමු සකසන ලද හෝ වෙනත්)* | *අපනයනය සිදුකරන රට* |
|---|---|---|---|---|---|
| | | | | | |

5. සමාගම්/ආයතන ලියාපදිංචි අංකය :
   සමාගම්/ආයතන අයිතියේ ස්වභාවය :
   ආයෝජන මණ්ඩල ලියාපදිංචි අංකය (තිබේ නම්) :
6. ධීවර නිෂ්පාදන සකසන/ඇසුරුම් කරන ස්ථානයේ ලිපිනය :
7. වාර්ෂික නිෂ්පාදන ධාරිතාව :
8. සකසන ලද නිෂ්පාදනයේ ඉලක්ක වෙළඳපොල (මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන වර්ග අනුව)
9. සේවක විස්තර :

| කාණ්ඩය | සේවක ගණන |
|---|---|
| | |

ඉහතින් සඳහන් කළ විස්තර සත්‍ය හා නිවැරදි බවට මා/අප මෙයින් සහතික කරමි/මු. මෙහි ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට හඳුනාගතහොත් මගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් ලබා දී ඇත්නම් එම බලපත්‍රය අවලංගු කිරීමටත් යටත් වන බවට මෙයින් එකඟ වෙමි.

අයදුම්කරුගේ අත්සන : .................................... දිනය : .........................................

උපලේඛනය - I

ආකෘති පත්‍ර 2

මසුන් හා ධීවර නිෂ්පාදන ආනයනය (සජීවී/සැකසූ/ධීවර ඇම) සඳහා ආයතන හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ අයදුම්පත

1. අයදුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම :
2. ලිපිනය :
3. සම්බන්ධතා අංකය (දුරකථන/ෆැක්ස්) සහ විද්‍යුත් තැපැල් ලිපිනය :
4. අපේක්ෂිත ආනයන කරන නිෂ්පාදනයේ වර්ගය :

| *මසුන් හා ධීවර නිෂ්පාදන වර්ගය (විශේෂ නාමය)* | *එච්. එස්. කේතය* | *නිෂ්පාදනයේ වර්ගය (ආහාර සඳහා, සුරතල් මසුන්, ධීවර ඇම හෝ වෙනත්)* | *නිෂ්පාදනයේ ස්වභාවය (සජීවී, අමු, සකසන ලද හෝ වෙනත්)* | *ආනයනය කරන රට* | *ආනයනය කිරීමේ අරමුණ* |
|---|---|---|---|---|---|
| | | | | | |

5. ව්‍යාපාර ලියාපදිංචි අංකය :
   ආයෝජන මණ්ඩල ලියාපදිංචි අංකය (තිබේ නම්) :
6. ආනයනය කරනු ලබන නිෂ්පාදන ගබඩා කරන, සකසන හා ඇසුරුම් කරන ස්ථානය :
7. ගබඩා කිරීමේ හා ඇසුරුම් කිරීමේ ධාරිතාවය :
8. වාර්ෂික ආනයන ප්‍රමාණයේ ඉලක්කය :
9. සේවක විස්තර :

| කාණ්ඩය | සේවක ගණන |
|---|---|
| | |

ඉහතින් සඳහන් කළ විස්තර සත්‍ය හා නිවැරදි බවට මා/අප මෙයින් සහතික කරමි/මු. මෙහි ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට හඳුනාගතහොත් මගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් ලබා දී ඇත්නම් එම බලපත්‍රය අවලංගු කිරීමටත් යටත් වන බවට මෙයින් එකඟ වෙමි.

අයදුම්කරුගේ අත්සන : .................................... දිනය : .........................................

*උපලේඛනය - I*

**ආකෘති පත්‍ර 3**

මසුන් හා ධීවර නිෂ්පාදන (සජීවී/සැකසූ) ආනයනය සහ ප්‍රතිඅපනයනය සඳහා ආයතන හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ අයදුම්පත

1. අයදුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම :
2. ලිපිනය :
3. සම්බන්ධතා අංකය (දුරකථන/ෆැක්ස්) සහ විද්‍යුත් තැපැල් ලිපිනය :
4. ලියාපදිංචියේ ස්වභාවය : (අ) සම්පූර්ණ ☐, (ආ) තුන්වන පාර්ශවයේ අපනයන ☐
5. අපේක්ෂිත ආනයනය කරනු ලබන නිෂ්පාදනයේ වර්ගය :

| *මසුන් හා ධීවර නිෂ්පාදන වර්ගය (විශේෂ නාමය)* | *එච්. එස්. කේතය* | *නිෂ්පාදනයේ වර්ගය (ආහාර සඳහා, සුරතල් මසුන්, ධීවර ඇම හෝ වෙනත්)* | *ස්වභාවය (සජීවී, අමු සැකසූ සහ වෙනත්)* | *ආනයනය කරන රට* | *ආනයනය කිරීමේ අරමුණ* |
|---|---|---|---|---|---|
| | | | | | |

6. ව්‍යාපාර ලියාපදිංචි අංකය :
   ආයෝජන මණ්ඩල ලියාපදිංචි අංකය (තිබේ නම්) :
7. ආනයනය කරනු ලබන නිෂ්පාදන ගබඩා කරන, සකසන හා ඇසුරුම් කරන ස්ථානය :
8. ගබඩා කිරීමේ හා ඇසුරුම් කිරීමේ ධාරිතාවය :
9. වාර්ෂික ආනයන ප්‍රමාණයේ ඉලක්කය :
10. සේවක විස්තර :

| කාණ්ඩය | සේවක ගණන |
|---|---|
| | |

ඉහතින් සඳහන් කළ විස්තර සත්‍ය හා නිවැරදි බවට මා/අප මෙයින් සහතික කරමි/මු. මෙහි ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට හඳුනාගතහොත් මගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් ලබා දී ඇත්නම් එම බලපත්‍රය අවලංගු කිරීමටත් යටත් වන බවට මෙයින් එකඟ වෙමි.

අයදුම්කරුගේ අත්සන : ....................................    දිනය : .........................................

*උපලේඛනය - 2*

| අංකය | ක්‍රමවේදය | වර්ගය | වාර්ෂික ලියාපදිංචි ගාස්තුව (රුපියල්) | | | |
|---|---|---|---|---|---|---|
| | | | වර්ගය - 1 (අවුරුද්දකට කිලෝ ග්‍රෑම් 10,000 අඩු) | වර්ගය - 2 (අවුරුද්දකට කිලෝ ග්‍රෑම් 10,000 හෝ එයට වැඩි) | වර්ගය - 3 (අවුරුද්දකට ඒකක 100,000 ට අඩු) | වර්ගය - 4 (අවුරුද්දකට ඒකක 100,000 හෝ එයට වැඩි) |
| 1 | ආනයනය පමණි | සජීවී ආහාරමය මසුන් | 5,000.00 | 10,000.00 | 5,000.00 | 10,000.00 |
| | | සජීවී නොවන අමු මසුන්, මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන | 10,000.00 | 20,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | ධීවර ඇම | 10,000.00 | 20,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | සජීවී ධීවර ඇම | අදාළ නැත | අදාළ නැත | 5,000.00 | 10,000.00 |
| 2 | ආනයනය පමණි | සජීවී ආහාරමය මසුන් | 50,000.00 | 100,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | සජීවී නොවන අමු මසුන්, මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන | 50,000.00 | 100,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | ධීවර ඇම | 25,000.00 | 50,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | සජීවී ධීවර ඇම | අදාළ නැත | අදාළ නැත | 25,000.00 | 50,000.00 |
| | | සුරතල් මසුන් | අදාළ නැත | අදාළ නැත | 25,000.00 | 50,000.00 |
| 3 | ආනයනය හා ප්‍රති අපනයනය | සජීවී ආහාරමය මසුන් | 50,000.00 | 100,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | සජීවී නොවන අමු මසුන්, මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන | 50,000.00 | 100,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | ධීවර ඇම | 25,000.00 | 50,000.00 | අදාළ නැත | අදාළ නැත |
| | | සජීවී ධීවර ඇම | අදාළ නැත | අදාළ නැත | 25,000.00 | 50,000.00 |
| 4 | වෙනත් ආනයන හා අපනයන | වෙනත් | 10,000.00 | 20,000.00 | 10,000.00 | 20,000.00 |

06 - 1108

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.